**පාසල් අධ්‍යාපන ක්‍රමය දැනුමේ කේන්ද්‍රීය පදනම ලෙස පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියේ (ටීඑස්ඊපී) - පළාත් මට්ටම - 2014**

---

පාසල් අධ්‍යාපන ක්‍රමය දැනුමේ කේන්ද්‍රීය පදනම ලෙස පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියේ (ටීඑස්ඊපී) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංස) අතර 2012 මැයි 18 දින එළඹි අංක 5037 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 2 හි II (ආ)(3) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඕස්ට්‍රේලියානු භාර අරමුදල හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2013 ජුලි 18 දින එළඹි අංක ටීඑෆ් 013267 දරන ඕස්ට්‍රේලියානු ප්‍රදාන ගිවිසුමේ II (ආ)(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මූල්‍ය හා ප්‍රදාන ගිවිසුම්වලට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියේ ජාතික මට්ටමේ කාර්යයන් සිදුකිරීමට අපේක්ෂා කරන අතර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ සියළුම පළාත් සභාවල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් පළාත් මට්ටමේ කාර්යයන් සිදුකිරීමට අපේක්ෂා කෙරේ. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් පළාත් මට්ටමින් සිදුකළ කාර්යයන් පිළිබඳ මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, රටේ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝග සඳහා යොමුවීමට 2012-2016 අධ්‍යාපන ක්ෂේත්‍ර සංවර්ධන කාර්යය රාමුවක් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහයෝගය ලබාදීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, ශ්‍රී ලංකාවේ දැනුම පදනම් වූ ආර්ථිකය සහ සමාජ සංවර්ධනය සඳහා අත්තිවාරමක් සැපයීම සඳහා ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන ප්‍රවේශය හා ගුණාත්මක බව වැඩි කිරීමයි. මූල්‍ය හා ප්‍රදාන ගිවිසුම්වලට අනුව, රු. මිලියන 11,000 කට සමාන විගැහි (SDR) මිලියන 64.1 ක (එජඩො මිලියන 100) ණය මුදලක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබූ අතර ඕස්ට්‍රේලියානු භාර අරමුදල විසින් එජඩො මිලියන 11.13 ක ප්‍රදාන සැපයීමට එකඟ වී තිබුණි. එයින් සියයට 70 පළාත් අධ්‍යාපන අධිකාරීන් සඳහා වෙන්කර තිබුණු අතර ඉතිරි සියයට 30 අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා වෙන්කර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2012 ඔක්තෝබර් 01 දින ආරම්භ කරන ලද අතර 2017 ජුනි 30 වන විට නිම කිරීමට නියමිතය. ප්‍රදාන යටතේ සිදුකළ යුතු කාර්යයන් 2016 අප්‍රේල් 30 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

පළාත් සභා නවය වෙනුවෙන් මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනසේ කළමනාකරණය තීරණය කරන එවැනි අත්‍යාවශ්‍ය අභ්‍යන්තර පාලනයන් ඇති කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ

වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද ප්‍රගති වාර්තා සහ වැඩි දියුණු කරන ලද මූල්‍ය වාර්තා ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන වියදම් සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ණය හා ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඈ) මුදල් රෙගුලාසි 150 සහ 2014 දෙසැම්බර් 01 දිනැති මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 239/2014 ට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කර තිබුණේද යන බව.

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව සහ

(ඊ) මූල්‍ය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-----

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ ,

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද පළාත් සභා නවයේ 2014 වර්ෂයේ විසර්ජන ගිණුම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 සහ 2014 දෙසැම්බර් 01 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 239/2014 හි සඳහන් විධිවිධානවලට අනුකූල වන පරිදි පිළියෙල කර ඉදිරිපත් කර ඇත. ඉහත විසර්ජන ගිණුම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්, වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා පළාත් සභා නවය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත්, ලේඛන හා වාර්තා සමඟ එකඟ වේ. 2014 වර්ෂය සඳහා ණය සහ ප්‍රදාන මුදල් වලින් දරන ලද පිරිවැය පළාත් සභා නවයේ විසර්ජන ගිණුම්වල සහ මෙහෙයුම් හා නියාමන සහාය ඒකකයේ නියමිත පරිදි වාර්තා කර තිබුණු බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) මූල්‍ය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------

ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව අනුව, සියලුම පළාත් සභාවල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ හා මෙහෙයුම් හා කළමනාකරණ සහාය ඒකකය විසින් සියළු මූලාශ්‍රවලින් ලද අරමුදල් වලින් දරන ලද මුලු ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 94.393 ක් විය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ අයවැය ඇස්තමේන්තු වලට සහාය වීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් හා ඕස්ට්‍රේලියානු භාර අරමුදලෙන් ලැබුණු අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂයේ අයවැයගත වෙන්කිරීම් සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාල වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමට අනුව මූල්‍යායනය කිරීමට එකඟ වූ අගය | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ජාසංස | 59 | 7,670 | 2,430 | 14 | 1,883 | 34 | 4,325 |
| ඕහාඅ | 11 | 1,430 | 550 | 4 | 522 | 13 | 1,657 |
| එකතුව | 70 | 9,100 | 2,980 | 18 | 2,405 | 47 | 5,982 |

## 3.2 භෞතික ප්‍රගතිය

මූල්‍ය ගිවිසුමේ උපලේඛන 01 අනුව ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනයට ප්‍රවේශවීම ප්‍රවර්ධනය, අධ්‍යාපන ගුණාත්මක බව ඉහළ නැංවීම හා පාලනය හා අධ්‍යාපන සේවා සැපයීම සවිබල ගැන්වීම යන ප්‍රධාන අරමුණු 03 යටතේ මුදල් වියපැහැදම් කිරීම් සම්බන්ධ දර්ශක සාක්ෂාත් කර ගැනීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදාළ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ලැබුණු තොරතුරුවලට අනුව , පළාත් පාසල් 135 ක මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සඳහා ගොඩනැගිලි ඉදිකිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට එම විද්‍යාගාර ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු සැලකියයුතු මට්ටමකට නිමකර තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(I) උතුරු මැද පළාතේ මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 15 සඳහා ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද පරිගණක හා අනෙකුත් උපකරණ අදාළ කාර්යයන් සඳහා යොදා නොගන්නා බව නිරීක්ෂණය විය. තවද, එම වත්කම් වල වගකීම් කාලයද ඉකුත් වී තිබුණි. ඊට අමතරව , සුදුසු සැපයුම්කරුවන් තෝරා ගැනීමේ හා ඔවුන් සමග ගිවිසුම්වලට එළඹීමේ අඩුපාඩු කිහිපයක්ද විගණනයේදී අනාවරණය විය.

(II) සබරගමුව පළාතේ මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 9 ක් සඳහා රු.60,372,500 ක පිරිවැයකට පරිගණක 589 ක් ප්‍රසම්පාදනය කිරීමේ ක්‍රියාපටිපාටිය වැරදි ලෙස සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල දක්වා ඇති නියමයන්ට පටහැනිව යොදා ගෙන තිබූ බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් පළාත් සභාව විසින් එකතුව රු.7,961,513 ක අතිරේක මුදලක් ගෙවා තිබුණි.

(III) නැගෙනහිර පළාතේ පාසල් 15 ක මහින්දෝදය විද්‍යාගාර ඉදිකිරීමේ කාර්යයන් නිමකර තිබුණද, 2015 අගෝස්තු 31 දිනට විද්‍යාගාර 02 ක් පමණක් ශිෂ්‍යයින්ගේ භාවිතය සඳහා විවෘත කර තිබුණි. අනිකුත් විද්‍යාගාර වසරකට වැඩි කාලයක් තිස්සේ කාමර ගරාවැටීමට ඉඩහරිමින් වසා දමා තිබුණි. එම නිසා රු.58,114,331 ක් වටිනා ගෘහ භාණ්ඩ හා උපකරණ සහ රු.24,527,750 ක් වටිනා පරිගණක 325 ක් උපයෝජනය නොකර පැවතුණු අතර එම වත්කම්වල වගකීම් කාලය ඉකුත් වී තිබුණි.

(IV) 2014 සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව , ව්‍යාපෘතිය විසින් රු.37,131,240 ක පිරිවැයකට පරිගණක 492 ක් ප්‍රසම්පාදනය කර තිබුණු අතර එම පරිගණක අතුරින් , පරිගණක 39 ක් නැගෙනහිර පළාතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ගබඩා පරිශ්‍රයේ අදාළ කාර්යයන් සඳහා භාවිතා කිරීමකින් තොරව උපයෝජනය නොකර පැවතුණි. ඊට අමතරව, පරිගණක ප්‍රසම්පාදනය කිරීම සඳහා වූ පිරිවිතරයන් හි සඳහන් වසර 03 ක වගකීම් කාලය කොන්ත්‍රාත් ගිවිසුමේ වසර 01 ක කාලයක් ලෙස වෙනස්ව දක්වා තිබුණි.

(ආ) අධ්‍යාපන සංවර්ධන සැලැස්මට අනුව , සමාලෝචිත වර්ෂය තුළ උතුරු මැද පළාතේ ද්විතීක පාසල්වල විදුහල්පතිවරුන් 200 ක් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් 300 ක් පුහුණු කිරීමට අපේක්ෂාකර තිබුණද, 2014 දෙසැම්බර් 31 දිනට විදුහල්පතිවරුන් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් 306 දෙනෙකු පමණක් පුහුණු කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ උතුරු පළාතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ලැබුණු මුළු මුදල වූ රු.288,468,038 ක් අතුරින්, එකතුව රු.183,447,367 ක් අදාළ කාර්යයන් සඳහා භාවිතා කිරීමකින් තොරව පොදු තැන්පතු ගිණුමට මාරු කර තිබුණි. තවද 2012 හා 2013 වර්ෂ තුළ උතුරු පළාතේ රු.20,460,000 ක පිරිවැයකට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති කාර්යයන්, අරමුදල් හිඟකම නිසා සම්පූර්ණයෙන් අත්හැරදමා තිබුණි. ඊට අමතරව, ව්‍යාපෘතිය විසින් උතුරු පළාත තුළ 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද වැඩසටහන් 13 ක කාර්යයන්වල සියයට 28 සිට සියයට 69 දක්වා වූ පරාසයක භෞතික ප්‍රගතියක් 2015 ජූලි 31 දිනට වාර්තා විය.

(ඈ) උතුරු මැද පළාතේ අවිධිමත් අධ්‍යාපන ඒකක 30 ක් සඳහා හදිසි ගෙඩනැගිලි අළුත්වැඩියා කිරීම් සිදුකිරීමට සමාලෝචිත වර්ෂය තුළ දී රු.1,800,000 ක මුදලක් වෙන්කර තිබුණද, 2014 දෙසැම්බර් 31 දින වන විටද එම කාර්යයන් ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, පුහුණු ගුරුවරුන්ගේ හිඟකම හේතුවෙන් එවැනි අවිධිමත් අධ්‍යාපන ඒකක වල අධ්‍යාපන වැඩසටහන් නොපැවැත්වීම හේතුවෙන් එකී ඒකකවල භාවිතය සඳහා ව්‍යාපෘතිය විසින් 2012-2014 තුළදී ප්‍රසම්පාදනය කරන ලද යන්ත්‍ර හා පුහුණු උපකරණ උපයෝජනය නොකර පැවති බව දිඹුලාගල, අනුරාධපුර, ගලෙන්බිඳුනුවැව, කැකිරාව, තඹුත්තේගම, හිඟුරක්ගොඩ හා පොළොන්නරුව අධ්‍යාපන කලාපවල සිදුකරන ලද විස්තරාත්මක විගණනයේදී අනාවරණය විය.

## 3.3 මූල්‍ය පාලනයට අදාල කරුණු

-----------------------------------

ව්‍යාපෘති කාලය තුළ මෙහෙයුම් හා නියාමන සහාය ඒකකයේ භාවිතය සඳහා ප්‍රසම්පාදනය කරන ලද රු.7,402,528 ක වටිනාකම වූ වත්කම් තහවුරු කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.